2026 පෙබරවාරි

ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය
ඉදිකිරීම්

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිකිරීම් කටයුතු සඳහා වන ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය වන සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය, 2026 පෙබරවාරි මාසයේ දී දර්ශකාංක 70.3ක අගයක් වාර්තා කළේය. පසුගිය මාසයේ දී වාර්තා වූ ඉතා ඉහළ දර්ශක අගයට සාපේක්ෂව අඩු වේගයකින් වුවද ඉදිකිරීම් කටයුතුවල අඛණ්ඩ වර්ධනයක් මෙමගින් පිළිබිඹු වෙයි. ඉදිකිරීම් ව්‍යාපෘති අඛණ්ඩව ලැබීම සහ යහපත් කාලගුණික තත්ත්වයන් හේතුවෙන් බොහෝ ඉදිකිරීම් සමාගම් විසින් පෙබරවාරි මාසයේ දී ඉදිකිරීම් අංශයේ යහපත් තත්ත්වයක් වාර්තා කරන ලදී.

සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූ බොහෝ දෙනෙකු විවිධ ඉදිකිරීම් ව්‍යාපෘති ලබා ගැනීමේ හැකියාව වැඩි වූ බව වාර්තා කළ බැවින් නව ඇණවුම් දර්ශකය මෙම මාසය තුළ තව දුරටත් වර්ධනය විය. නව ව්‍යාපෘති ලබා ගැනීමේ හැකියාව ඉදිරියටත් පවතිනු ඇති බවට වන අපේක්ෂාවන් පිළිබිඹු කරමින් සේවා නියුක්ති දර්ශකය ඉහළ වේගයකින් වර්ධනය විය. ඉහළ ගිය ඉදිකිරීම් ක්‍රියාකාරකම් අනුව යමින් තොග මිලදී ගැනීම් දර්ශකය ද වර්ධනය විය. මේ අතර, ඉදිකිරීම් කටයුතු සඳහා ඇති ඉහළ ඉල්ලුම සහ චීන අලුත් අවුරුදු සැමරුම් ආශ්‍රිත ආනයන ප්‍රමාදයන් පිළිබිඹු කරමින් ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය මාසය තුළ තවදුරටත් වැඩි විය.

ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය

විචල්‍යය	ජන.	පෙබ.	+/-	දිශානතිය
ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය)	**75.0**	**70.3**	-	**අඩු වේගයකින් ඉහළ යෑමක්**
නව ඇණවුම්	77.8	70.3	-	අඩු වේගයකින් ඉහළ යෑමක්
සේවා නියුක්තිය	54.2	56.8	+	වැඩි වේගයකින් ඉහළ යෑමක්
තොග මිලදී ගැනුම්	65.3	55.4	-	අඩු වේගයකින් ඉහළ යෑමක්
ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය	54.2	56.9	+	වැඩි වේගයකින් ඉහළ යෑමක්

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිකිරීම් ව්‍යාපෘති ඉදිරියටත් පවතිනු ඇතැයි අපේක්ෂාවෙන් ඉදිකිරීම් කටයුතු සඳහා ඉදිරි දැක්ම ඉහළ මට්ටමක පවතී. කෙසේ වෙතත්, මැදපෙරදිග ගැටුම්කාරී තත්ත්වය හේතුවෙන් සිදුවිය හැකි අමුද්‍රව්‍ය පිරිවැය ඉහළ යෑම සහ සැපයුම් බාධාවන් හේතුවෙන් ඇතිවිය හැකි අවදානම් පිළිබඳව ඉදිකිරීම් සමාගම් සිය අවධානය යොමුකර ඇත.

ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය)

70.3

2026 පෙබරවාරි

ඉදිකිරීම් අංශයේ සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය



මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ගෝලීය ප්‍රවණතා

ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්

රට/ කලාපය	දිශානතිය
යුරෝපා කලාපය	අඩු වේගයකින් පහත වැටීමක්
ප්‍රංශය	අඩු වේගයකින් පහත වැටීමක්
ජර්මනිය	වැඩි වේගයකින් පහත වැටීමක්
අයර්ලන්තය	පහත වැටීමක සිට ඉහළ යෑමක්
ඉතාලිය	වැඩි වේගයකින් පහත වැටීමක්
එක්සත් රාජධානිය	වැඩි වේගයකින් පහත වැටීමක්

මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2026 මාර්තු 31 වන දිනට

[1] එස්&පී ග්ලෝබල් (S&P Global) ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.

* 2026 පෙබරවාරි මාසයේ ඉදිකිරීම් අංශයේ ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සමීක්ෂණය සඳහා දත්ත රැස් කිරීම 2026 මාර්තු 27 දක්වා සිදු කරන ලදී.

තාක්ෂණික සටහන:

ක්‍රමවේදය

දර්ශක සම්පාදනය සහ අර්ථ නිරූපණය සඳහා එස්&පී ග්ලෝබල් (S&P Global) ආයතනයෙහි සමීක්ෂණ ක්‍රමවේදය අනුගමනය කරයි.
පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, ඉදිකිරීම් අංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස ගැනෙන අතර, එය **ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** ලෙස හඳුන්වනු ලබයි. තවද, ඉදිකිරීම් අංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය සහ සේවා අංශයේ සේවා ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සමඟ සැසඳිය හැකිය.

දර්ශකය

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවති ඇත.
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

නියැදිය

මාසික ප්‍රතිචාර 35ක් පමණ ආවරණය වන පරිදි ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිව ඇති ඉහළම ශ්‍රේණිගත දේශීය ඉදිකිරීම් සමාගම් ඉලක්ක කර ගනිමින් පසුගිය මාසයට සාපේක්ෂව අදාළ මාසයේ දී ඉදිකිරීම් කටයුතු වල ප්‍රවණතා ග්‍රහණය කරගැනීම සඳහා මෙම සමීක්ෂණය සිදු කරනු ලබයි.

විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්

සේවා නියුක්තිය : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන
තොග මිලදී ගැනුම් : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය
ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය
අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.